සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

7 ශ්‍රේණිය **භූගෝල විද්‍යාව** කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

01 ශ්‍රී ලංකාව ඉන්දියාවට ................................................................ දෙසින් පිහිටා ඇත. (උතුරු / දකුණු / බටහිර)

02 පෘතුවි ගෝලයේ උතුරේ සිට දකුණට විහිදෙන මනඃකල්පිත රේඛා ............................................ රේඛා වේ. (අක්ෂාංශ / දේශාංශ / ධ්‍රැව)

03 පෘථිවි පෘෂ්ඨයෙන් විශාල ප්‍රමාණයක් ............................ වැසී ඇත. (ජලයෙන් / ගොඩබිමින් / බෑවුම් වලින්)

04 ලෝකයේ කුඩාම සාගරය වන්නේ ......................................... සාගරයයි. (ඉන්දියන් / අත්ලන්තික් / ආක්ටික්)

05 ශ්‍රී ලංකාවේ භූ දර්ශනයෙහි කැපීපෙනෙන භූ විෂමතා ලක්ෂණ රාශියක් දැකිය හැක්කේ .......................................................... භූ දර්ශනය තුළය. (කඳුකර කලාපීය / වියළි කලාපීය / තෙත් කලාපීය)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 ශ්‍රී ලංකාවට නොවැම්බර් සිට ජනවාරි දක්වා අධික වැසි ලැබෙන්නේ ඊසාන දිග මෝසම් සුළං මගිනි. (   )

07 කෝනේෂ්වරම් කෝවිල පිහිටා ඇත්තේ යාපනය දිස්ත්‍රික්කයේය. (   )

08 2010 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව 92% කි. (   )

09 ශ්‍රී ලංකාව සෞම්‍ය කලාපීය දේශගුණයට අයත් රටකි. (   )

10 කයිට්ස් යාපන අර්ධද්වීපය අසල පිහිටි දූපතකි. (   )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැනමත ලියන්න.**

11 වෙරළේ සිට නාවික සැතපුම් .................................... දක්වා විහිදෙන්නේ ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රිය මුහුදු සීමාවයි.

12 කැස්පියන් මුහුද හා එරල් මුහුද ............................................................................ මහාද්වීපය තුළ පිහිටා ඇත.

13 ශ්‍රී ලංකාවේ මුළු භූමියෙහි වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් ............................................................................ කි.

14 පෘථිවිය ධ්‍රැවාසන්නයේ දී ............................................................................................................ ස්වභාවයක් ගනී.

15 ............................................................ වනාන්තරය ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුමයක් ලෙස සලකනු ලබයි.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16 ලෝකයේ කුඩාම මහාද්වීපය වන්නේ මින් කුමක් ද?

(1) යුරෝපා මහාද්වීපය (2) ඇන්ටාක්ටික් මහාද්වීපය

(3) ඕස්ට්‍රේලියා මහාද්වීපය (4) උතුරු ඇමරිකා මහාද්වීපය

17 පෘථිවියේ හැඩය පිළිබඳ වඩාත්ම නිවැරදි පිළිතුර තෝරන්න.

(1) පරිපූර්ණ ගෝලාකාර හැඩයකින් යුක්තවේ.

(2) සමක පරිධිය, ධ්‍රැවක පරිධියට වඩා විශාල වේ.

(3) අර්ධ ගෝලයක් ලෙස දිස්වේ.

(4) ධ්‍රැවක පරිධිය, සමක පරිධියට වඩා විශාල වේ.

18 වියළි කලාපයේ පිහිටි ශේෂ කන්දක් වන්නේ මින් කුමක් ද?

(1) නමුණුකුල කන්ද ය. (2) සමනල කන්ද ය.

(3) රිටිගල කන්ද ය. (4) කිරිගල්පොත්ත කන්ද ය.

19 කඳුකර භූදර්ශනයට අයත් වන්නේ මුහුදු මට්ටමේ සිට,

(1) මීටර් 500 වැඩි උස් බිම්ය. (2) මීටර් 100 වැඩි උස් බිම්ය.

(3) මීටර් 300 වැඩි උස් බිම්ය. (4) මීටර් 1000 වැඩි උස් බිම්ය.

20 ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපය තුළ කරනු ලබන කෘෂි කර්මාන්තයේ දී බහුල වශයෙන් යොදාගන්නා ජල සම්පාදන ක්‍රමය වන්නේ,


(1) ගංගා ජලය (2) ආඩියා ළිං ජලය (3) වර්ෂා ජලය (4) වාරි තාක්ෂණය

**7 ශ්‍රේණිය** # භූගෝල විද්‍යාව - II කොටස

සැලකිය යුතුයි

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 (i) පහත සඳහන් ලෝක ආකෘති සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (ල.06)




(1) සමකය දැක්වෙන අක්ෂරය ........................................................................ වේ.

(2) අත්ලාන්තික් සාගරය දැක්වෙන අක්ෂරය ........................................................................ වේ.


(3) ලෝකයේ විශාලතම දූපත දැක්වෙන අක්ෂරය ........................................................................ වේ.

(4) D අක්ෂරයෙන් දැක්වෙන මහාද්වීපය ........................................................................ යි.

(5) මැඩගස්කර දූපත දැක්වෙන අක්ෂරය ........................................................................ වේ.

(6) G අක්ෂරයෙන් දැක්වෙන දූපත් සමූහය ........................................ දූපත් ලෙස හඳුන්වයි. (ල. 06)

(ii) පහත දැක්වෙන ශ්‍රී ලංකා ආකෘතික සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ල.06)




(1) නිරිත දිග මෝසම දැක්වෙන අක්ෂරය .......................... වේ.

(2) A අක්ෂරයෙන් දැක්වෙන වරාය .......................................... යි.

(3) මහවැලි ගඟ දැක්වෙන අක්ෂරය .................................... වේ.

(4) E අක්ෂරයෙන් සේයා කර ඇති දිස්ත්‍රික්කය ...................................... යි.

(5) මන්නාරම් දූපත දක්වා ඇති අක්ෂරය ............................ වේ.

(6) G අක්ෂරයෙන් දැක්වෙන නගරය .................................. වේ.

(ල. 06)

(iii) ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල වැවෙන ශාක වල ස්වභාවය අනුව ඒවා විවිධ පරිසර පද්ධති වලට වෙන් කරයි. පහත රූපවලින් දක්වෙන්නේ එවැනි පරිසර පද්ධති වල වැවෙන ශාක වර්ගයි. එම රූප හඳුනාගෙන ඒවා අයත් පරිසර පද්ධති අක්ෂර පිළිවෙලින් නම් කරන්න. (ල.04)

| A | B | C | D |
| --- | --- | --- | --- |
|  |  |  |  |


02 (i) ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් වර්ග දෙකකි. ඒ ආශ්‍රිත තොරතුරු මෙහි දක්වා ඇත. ඒවා ගැලපෙන සේ අංක 01 හා 02 ට වෙන්කර ලියා දක්වන්න. (ල.08)

1. ස්පෘශ්‍ය උරුම
2. අස්පෘශ්‍ය උරුම

1. හික්කඩුව වෙරළ
2. දිය ඇළි
3. සිරිත් විරිත්
4. සාහිත්‍යය
5. ශ්‍රී මහා බෝධිය
6. ආගන්තුක සත්කාරය
7. නාමල් උයන
8. වැඩිහිටියන්ට සැලකීම

(ii) ශ්‍රී ලාංකික ජන සමාජයේ විවිධ ජාතීන් ජීවත් වේ. ඒ අනුව සිංහල, දෙමළ, මුස්ලිම් ප්‍රධාන තැනක් හිමිකර ගන්නා ජාතීන්ය. එම ජාතීන්ට ආවේණික වූ ආගමික/සංස්කෘතික උත්සව 03 ක් පිළිවෙලින් සඳහන් කරන්න. (ල.03)

03 පෘථිවි ආදර්ශගෝලයේ රූප සටහනක් පහතින් දක්වේ. ඒ ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(1) ඉහත ආදර්ශගෝලයේ AB රේඛාවෙන් දක්වෙන ප්‍රධාන දේශාංශ රේඛාව නම් කරන්න. (ල.02)

(2) ඉහත ආදර්ශ ගෝලයේ අක්ෂාංශ 0º රේඛාව හඳුන්වන නම කුමක් ද? (ල.02)

(3) අක්ෂාංශ 0º රේඛාවෙන් පෘථිවි ගෝලය කොටස් දෙකකට බෙදෙයි. එම කොටස් දෙක නම් කරන්න. (ල.02)

(4) E, F රේඛාවෙන් දක්වෙන අක්ෂාංශ රේඛාව නම් කරන්න. (ල.02)

(5) රටක පිහිටීම දක්විය හැකි ක්‍රම දෙකකි. එම ක්‍රම දෙක සඳහන් කරන්න. (ල.03)

04 පහත සඳහන් උපකාරක පද යොදා ගනිමින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

(4) දකුණු අර්ධගෝලයේ පිහිටි වැදගත් අක්ෂාංශ රේඛාවකි.

(5) වයඹ පළාතේ පිහිටි ප්‍රධාන ඔයකි.

(6) ඉහළ අහසේ ජලවාෂ්ප එක්වීමෙන් මේවා සෑදේ.

(7) ලෝකයේ උසම කඳු වැටිය.

(11) ගංගා ඇළ දොළවල ජලය ගලා විත් මෙයට එක්වේ.

<u>පහළට</u>

(1) පෘථිවි ගෝලයේ තිරස්ව හරි මැදින් බෙදෙන රේඛාව මේ නමින් හඳුන්වයි.

(2) මුහුදේ රළ ඇවිත් මෙහි වැදේ.


(3) ලංකාවේ උසම කන්ද මෙය වේ.

(5) ලිපගිනි මෙලවීමට මේවා යොදාගනී.

(8) දකුණු පළාතේ පිහිටි දිස්ත්‍රික්කයකි.

(9) වී ගොවිතැන් කරන කන්නකි.

(10) උස් සම බිම මේ නමින් හඳුන්වයි.




(ල. 11)


05 (i) පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ විවිධ භූ දර්ශන හා ඒවාට ආවේණික ලක්ෂණ වේ. ඒවා ගැලපෙන පරිදි යා කරන්න.

| | |
|---|---|
| (a) කඳුකර භූ දර්ශනය | (1) හුණු ගල් පස බහුලව ඇත. |
| (b) වියළි කලාපීය භූ දර්ශනය | (2) අධික ජනගහනයක් වාසය කරයි. |
| (c) තෙත් කලාපීය භූ දර්ශනය | (3) අධික වර්ෂාපතනයක් ලැබේ. |
| (d) යාපනය භූ දර්ශනය | (4) බොකු කලපු හා තුඩු පිහිටා ඇත. |
| (e) වෙරළ ආශ්‍රිත භූ දර්ශනය | (5) වැව් විශාල ප්‍රමාණයක් පිහිටා ඇත. |
| | (6) දිය ඇළි සානු කඳු වැටි පිහිටා ඇත. (ල.06) |

(ii) A ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ පිහිටි ප්‍රධාන කඳු පංති 03 ක් නම් කරන්න. (ල.03)

B ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ පිහිටි දිය ඇලි දෙකක් නම් කරන්න. (ල.02)

06 (i) දකුණු ආසියානු කලාප සිතියම පහතින් දැක්වේ. එහි අක්ෂර වලින් දැක්වෙන රටවල නම් වරහන් තුළින් තෝරා ඉදිරියෙන් ලියන්න. (ල. 06)




(නේපාලය / භූතානය / මාලදිවයින / ඉන්දියාව බංගලාදේශය / පකිස්ථානය)

A .............................
B .............................
C .............................
D .............................
E .............................
F ශ්‍රී ලංකාව
G .............................

(ii) වරහන් තුළ ඇති නිවැරදි පිළිතුරු තෝරා පහත හිස්තැන් පුරවන්න.

පෘථිවිය නිර්මාණය වී ඇත්තේ විශාල සාගර හා මහාද්වීප වලිනි. සාගර ජලයෙන් වට වූ විශාල ගොඩබිම් ප්‍රදේශ (1)............................... ලෙස හඳුන්වනු ලබයි. ලෝකයේ පිහිටා ඇති විශාලතම සාගරය (2)................................. වේ. (3)................................. කඳු මුදුන ලෝකයේ උසම ස්ථානය වන අතර ලෝකයේ ගැඹුරුම ස්ථානය (4)................................. අගාධය වේ. ඉන්දියන් සාගරයේ (5)................................. ක් ලෙස ශ්‍රී ලංකාව පිහිටා ඇත.

(එවරස්ට් / දූපත / මරියානා / අත්ලාන්තික් / පැසිෆික් / මහාද්වීප) (ල.05)

07 (i) ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය උසස් මට්ටමක පැවතීම කෙරෙහි බලපාන සාධක කිහිපයක් පහත කොටුවලින් දැක්වේ. එම සාධක වගුවේ ඇති එක් එක් අංශය යටතට වෙන් කර දක්වන්න.

| පෝෂ්‍යදායි ආහාර වේලක් ලබාගත හැකිවීම. | වෛද්‍ය හා සෞඛ්‍යය පහසුකම් දියුණු වීම. | අධ්‍යාපන පහසුකම් දියුණු වීම |
|---|---|---|
| උදා.:- ලෙඩ රෝග වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිවීම.<br>1. ........................................<br>2. ........................................ | ආයු අපේක්ෂාව වැඩිවීම.<br>3. ........................................<br>4. ........................................ | සාක්ෂරතාව වැඩි දියුණු වීම.<br>5. ........................................<br>6. ........................................<br>7. ........................................<br>8. ........................................ |

- ලෙඩරෝග වලට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි වීම.
- ආයු අපේක්ෂාව වැඩිවීම.
- ජීවන මට්ටම ඉහළ යාම.
- යහපත් ආකල්ප ඇතිවීම.

- කායික හා මානසික පෝෂණය වැඩි වීම.
- ආයු අපේක්ෂාව වැඩි වීම.
- ළදරු මරණ අඩු වීම.
- හොඳ රැකියා අවස්ථා ඇතිවීම.

- ආයු අපේක්ෂාව වැඩිදියුණු වීම.
- මාතෘ මරණ අඩු වීම.
- සෞඛ්‍යය සම්පන්න ජීවිතයක් ගතකිරීමට පෙළඹීම.

(ල.08)

(ii) ශ්‍රී ලංකාවේ ජනතාවගේ අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව ඉහළ මට්ටමක පැවතීමට බලපාන කරුණු 03 ක් සඳහන් කරන්න. (ල.03)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) දකුණු (02) දේශාංශ (03) ජලයෙන් (04) ආක්ටික් (05) කඳුකර කලාපීය (06) ✓
(07) × (08) ✓ (09) × (10) ✓ (11) 12 (12) ආසියා (13) 65610
(14) පැතලි (15) සිංහරාජ (16) ඕස්ට්‍රේලියා මහාද්වීපය (17) සමක පරිධිය, ධ්‍රැවක පරිධියට වඩා විශාල වේ.
(18) රිටිගල කන්ද (19) 300m වඩා උස් බිම්ය. (20) ආඩියා ළිං (2 x 20 = 40)

## II කොටස

01 (i) (1) A-A (2) B (3) C (4) ආසියාව
(5) E (6) ජපන් (ල.06)
(ii) (1) C (2) ත්‍රිකුණාමලය (3) D (4) නුවරඑළිය
(5) F (6) යාපනය (ල.06)
(iii) A - තෙත්කලාපීය B - තෘණ තලා C - ශුෂ්ක කටුපඳුරු D - කඩොලාන (ල.04)

02 (i) ● ස්පර්ශ උරුම - 1, 2, 5, 7 ● අස්පර්ශ උරුම - 3, 4, 6, 8 (ල.08)
(ii) ● සිංහල - වෙසක්, පොසොන්, සිංහල අවුරුද්ද ආදී..
● දෙමළ - දීපවාලී, සිංහල දෙමළ අවුරුදු ආදී....
● මුස්ලිම් - රාමසාන්, හජ්ජි උත්සවය ආදී (ගැළපෙන පිළිතුරක් ඇත්නම් ලකුණු ලැබේ.) (ල.03)

03 (1) ගිනිච් මධ්‍යහන රේඛාව (ල.02) (2) සමකය (ල.02)
(3) උතුරු අර්ධ ගෝලය, දකුණු අර්ධ ගෝලය (ල.02) (4) කර්කටන නිවර්තනය (ල.02)
(5) නිරපේක්ෂ පිහිටීම හා සාපේක්ෂ පිහිටීම (එක් පිළිතුරකට ල. $1\frac{1}{2}$) (ල.03)

04 <u>හරහට</u>
(4) මකර (5) දඳුරු ඔය (6) වලාකුළු (7) හිමාලය (11) සාගරය
<u>පහළට</u>
(1) සමකය (2) වෙරළ (3) පිදුරුතලාගල (5) දූව (8) මාතර
(9) යල (10) සානුව
(ල. 11)

05 (i) (a) කඳුකර භූ දර්ශනය 6 (b) වියළි කලාපීය භූ දර්ශනය 5
(c) තෙත් කලාපීය භූ දර්ශනය 2, 3 (d) යාපන භූ දර්ශනය 1
(e) වෙරළ ආශ්‍රිත භූ දර්ශනය 4 (ල. 06)
(ii) නිවැරදි පිළිතුරු ලබා දී ඇත්නම් ලකුණු ලැබේ. (ල.03)
නිවැරදි පිළිතුරු ලබා දී ඇත්නම් ලකුණු ලැබේ. (ල.02)

06 (i) A පකිස්ථානය B නේපාලය C භූතානය D බංගලාදේශය
E ඉන්දියාව G මාලදිවයින (ල. 06)
(ii) (1) මහාද්වීප (2) පැසිෆික් (3) එවරස්ට් (4) මරියානා ආගාධය (5) දූපත (ල.05)

07 (i) ● පෝෂ්‍යදායී ආහාරවේලක් ලබාගැනීම.
★ කායික මානසික පෝෂණය. ★ ආයු අපේක්ෂාව වැඩීම.
● වෛද්‍ය හා සෞඛ්‍යය පහසුකම්
★ ළදරු මරණ අඩු වීම. ★ මාතෘ මරණ අඩු වීම.
● අධ්‍යාපන පහසුකම් දියුණු වීම.
★ ජීවන මට්ටම ඉහළ යාම. ★ හොඳ රැකියා අවස්ථා ඇතිවීම.
★ යහපත් ආකල්ප ඇතිවීම. ★ සෞඛ්‍ය පහසුකම් ජීවිතයක් ගතකිරීම. (ල.08)
(ii) ● නොමිලේ පොත් ● නොමිලේ අධ්‍යාපනය ● නොමිලේ නිළ ඇඳුම් ආදි පිළිතුරු 03 ක් (ල.03)